50

# හින්දුස්තානි රාගධාරී සංගීතයේ සංගීත චිකිත්සක ගුණය

*බී. සජිනි තාරකා කුරේ* [1]
HS/2013/0116

සංගීත චිකිත්සාව සඳහා හින්දුස්තානි රාගධාරී සංගීතය භාවිත කළ හැකි බව තහවුරු කෙරෙන සාධක පිළිබඳ ගවේෂණය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ යි. මේ සඳහා නියැදිය ලෙස කැලණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථීන් 20 දෙනෙකු ප්‍රශ්නාවලියක ට යොමු කිරීමෙන් රැස්කර ගත් තොරතුරු යොදා ගනු ලැබේ. මෙහිදී හින්දුස්තානී සංගීතය හදාරන හා හින්දුස්තානී සංගීතය විෂයක් ලෙස හැදෑරීම නොකරන විද්‍යාර්ථීන් 10 දෙනා බැගින් තෝරා ගනු ලැබේ. ප්‍රශ්නාවලියට අමතර ව අන්තර්ජාල වාර්තා, පුවත්පත් වාර්තා, පුස්තකාල භාවිතය හා ලොව සංගීත චිකිත්සකවේදීන්ගේ පර්යේෂණ කීපයක් ද මූලාශ්‍ර ලෙස යොදා ගනියි. මීට අමතර ව සංගීත භාණ්ඩ කීපයක හඬ ඉහත විද්‍යාර්ථීන් පිරිසට ඇසීමට සලස්වා හින්දුස්තානී සංගීත භාණ්ඩ කෙරෙහි ඔවුන්ගේ රුචිකත්වය අනුව ද ඉහත අරමුණ ගවේෂණය කරනු ලැබේ. වෙනත් රටවල හා ශ්‍රී ලංකාවේ සංගීත චිකිත්සකවේදීන්ගේ පර්යේෂණ මඟින් හින්දුස්තානී රාග පද්ධතියේ අඩංගු රාගවල පවතින රෝග සුව කිරීමේ ගුණය පිළිබඳ ව ද සාහිත්‍යයමය මූලාශ්‍ර ආශ්‍රයෙන් ගවේෂණයට ලක් කෙරේ. කෙසේ වෙතත් ප්‍රශ්නාවලිය මඟින් ලබා ගත් තොරතුරු අනුව බොහෝ විද්‍යාර්ථීන් තම මානසික ආතතිය දුරු කර ගැනීමට අනෙක් සංගීත සම්ප්‍රදායන්ටත් වඩා හින්දුස්තානී සංගීතය ඇසුරු කරන බව නිගමනය කළ හැකි විය. සංගීත භාණ්ඩ කෙරෙහි ඇති රුචිකත්වය සසඳා බැලූ කල හින්දුස්තානී සංගීත භාණ්ඩ කෙරෙහි වැඩි කැමැත්තක් නිරීක්ෂණය විය. එමඟින් නිගමනය කළ හැකි වන්නේ රෝග සුව කිරීමට හින්දුස්තානි රාගධාරී සංගීතය භාවිත කළ හැකි බවයි.

ප්‍රමුඛ පද : හින්දුස්තානි රාගධාරී සංගීතය, සංගීත චිකිත්සාව, මානසික ආතතිය, සංගීත චිකිත්සකවේදීන්, රාග පද්ධතිය.

*1 ප්‍රාසංගික කලා - විශේෂවේදී පළමු වසර sajinitharaka26@gmail.com*